	(iii)XIX හි කොටස 7 හි උප කොටස	386,606/-	වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හිමි රජයේ නිල නිවසේ පදිංචිව සිටි වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ සේවය කර 2021 පෙබරවාරි 22 දින විශ්‍රාමලත් මාණ්ඩලික නිලධාරියාගේ කුලී සහ දඩ මුදල් හිඟ අය කිරීමට පසුගිය වසර 04 කට අධික කාලයක් පියවර ගෙන නොමැත.
(ඇ)	2007 අප්‍රේල් 20 වන දින 22/2006 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව	244,283/-	වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් JC 22 අංක යෙදූ රජයේ නිල නිවස 2020 සැප්තැම්බර් මස 09 වන දිනයේදී හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලබා දී තිබුණද අදාල නිල නිවාසයට ගෙවිය යුතු කුලී හිඟ අය කිරීමට පසුගිය වසර 02 කට අධික කාලයක් පියවර ගෙන නොමැත.

3.6 තැන්පත්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිසර අමාත්‍යාංශය මගින් වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට 2023 වර්ෂයේ ලැබුණ රු.309,578/- ක මුදල (බිම් බෝම්බ ඉවත් කිරීමේ) “Land Mining” ගෙවීම් සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දක්වා නිසි පියවර නොගෙන පසුගිය මාස 14 කට අධික කාලයක් තැන්පතුවේ තබා ගැනීම නිරීක්ෂණය විය.

(ආ) හින්දු සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලැබුණ 2024 වර්ෂයේ සංස්කෘතික වැඩසටහන් සඳහා වූ රු.75,000/- ක් අදාල අරමුණ සඳහා උපයෝගී කර නොතිබීම නිරීක්ෂණය විය.

4. ක්‍රියාකාරකම් සමාලෝචනය

4.1 ක්‍රියාකාරිත්වය

4.1.1 ක්‍රියාකාරකම් ඉටු නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ වල පදිංචි කෘෂිකාර්මික කටයුතු වල නිරත ඉඩම් නොමැති පුද්ගලයන් හට ඉඩම් ලබා දීමත්, දැනට ඉඩම් කැබැල්ලක් සඳහා සුදුසුකම් සපුරා ඇති නමුත් නීත්‍යානුකූල හිමිකමක් නොමැති පුද්ගලයන් හට විධිමත් බලපත්‍රයක් ලබා දීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 වන දින 2008/4 දරණ ඉඩම් කළමනාකරණ විධිමත් කිරීම සඳහා වන චක්‍ර ලේඛ ප්‍රකාරව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් ඉඩම් කච්චේරියක් පවත්වා ඉඩම් සම්බන්ධයෙන් පවත්නා ගැටළු තීරණය කිරීමට පියවර ගතයුතු නමුත්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ග්‍රාම නිලධාරි කොට්ඨාශ 100 කින් ඉඩම් කච්චේරි සඳහා ඉල්ලුම්පත් 9713 ක් ලැබී තිබුණ ද වසර 1-10 දක්වා අධික කාලයක සිට ඉඩම් කච්චේරි පැවැත්වීමට පියවර ගෙන නොමැත.

(ආ) මහජනතාව වෙත ලබා දිය යුතු බලපත්‍ර 1970 ක් (Permit) සහ දීමනාපත්‍ර 1524 ක් (Grants) අදාල පුද්ගලයන් වෙත ලබා දීමට පසුගිය වසර 02 සිට වසර 42 කට අධික කාලයක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 4 ක්ම පියවර ගෙන නොතිබුණි.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වීම

ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.291,639,356/- වියදමින් ඉදිකරන ලද වවුනියා ආර්ථික මධ්‍යස්ථාන 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට භාරදී තිබුණ ද මේ වාර්තාව සකසන දින තෙක් මහජන භාවිතයට භාරදී නොමැති අතර, 2018 සිට 2024 දක්වා ආරක්ෂක සේවා ගාස්තු, පිරිසිදු කිරීම් වියදම්, ජල ගාස්තු සහ මධ්‍යස්ථානය සඳහා උපකරණ වල මිලදී ගැනීම් වියදම් වශයෙන් රු.15,020,601/- ක් වැය කර ඇත.

4.1.3 ව්‍යාපෘතිය සම්පූර්ණ නොකර අතහැර දැමීම

වවුනියා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ඇතුළත් පරනාට්ටකල් පෙර පාසල් ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වැඩ ප්‍රජා කමිටුවක් මගින් කොන්ත්‍රාත් ක්‍රමයට රු.මිලියන 02 ක ඇස්තමේන්තුවේ 2019 වර්ෂයේ දෙසැම්බර් 06 වන දින සම්පූර්ණ කළ යුතු නමුත් සමාලෝචන දින තෙක් සම්පූර්ණ නොවී පවතින අතර, මෙම වැඩ සඳහා මුළු එකතුව රු.1,551,712/- ක් වැය කළ නමුත් වැඩ සම්පූර්ණ නොවීමෙන් මෙය නිශ්ඵල වියදමක් ලෙස සැලකේ.

4.1.4 මුදල් නිදහස් කළ නමුත් අපේක්ෂිත ක්‍රියාකාරී ප්‍රගතියක් ලබා නොගත් ව්‍යාපෘති

නැවත පදිංචි කිරීම් සහ නිවාස නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් 2023 සහ 2024 වර්ෂ වල ලබා දෙන ලද රු.මිලියනයක් සහ රු.මිලියන 0.5 ක නිවාස යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් සහ රු.මිලියන 0.6 කින් සමන්විත නිවාස යෝජනා ක්‍රමයේ වැඩ සමාලෝචිත දිනය තෙක් සම්පූර්ණයෙන් ඉටු නොවූවද සම්පූර්ණ ගෙවීම් ඔවුන්ගේ බැංකු ගිණුම් වල තැන්පත් කර මුදල් ආපසු ලබා ගත නොහැකි පරිදි මුළු මුදල රු.1,396,000/- රඳවා තබා තිබීම නිරීක්ෂණය විය.

4.2 දේශීය මුදල් යොදවන ලද ව්‍යාපෘති

4.2.1 ව්‍යාපෘති ඉටු කිරීම් වල පවත්නා අඩුපාඩු

ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් වවුනියා ප්‍රාදේශිය කාර්යාලිය ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන වැඩ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් ගිවිසුම් 06 ඔස්සේ රු.23,075,278/- ක වියදමින් කාර්යාල ගොඩනැගිල්ල, රැඳී සිටීමේ කවුළුව, වැසිකිළිය සහ වටා තාප්පය යනාදි පුනරුත්ථාපන වැඩ 2023 නොවැම්බර් 14 සිට 2024 ඔක්තෝබර් 06 වන දිනැති කාලය තුළ සිදු කෙරිණ. මෙම වැඩ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වවුනියා ප්‍රාදේශිය කාර්යාලයේ ගොඩනැගිලි පුනරුත්ථාපන වැඩහි BOQ item No. 17 හි Provisional sum for removing & Reinstallation of Air condition repairing and service, gas filling and pipe changing and necessary specials directed වැඩ අවසන් වූ බවට සඳහන් කර රු.300,000/- ගෙවීම් කර තිබුණ නමුත් අදාල වැඩ BOQ වලට අනුව ක්‍රියාත්මක කර අවසන් කර නොමැත.

(ආ) ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වවුනියා ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන වැඩහි BOQ item No. 42 යටතේ සඳහන් අලවන ලද Interlock paving blocks අදාල පිළිගත හැකි strength සහතික කිරීමේ සහතිකය ලබා නොගත් අතර අදාල වැඩ කොටසද නිසි අයුරින් සිදු කර නොමැත.

(ඇ) සින්න පුදුක්කුලම් ග්‍රාම සංවර්ධන සංගමය, කෝවිල් පුදුක්කුලම් ග්‍රාම සංවර්ධන සංගමය විසින් සිදුකළ වැඩ පිළිවෙලින් Renovation of regional office main building shade and Ex works (GA/VA/EN/2024/12) සහ Renovation or Passport office toilet work (GA/EN/2023/24) ආදියට අදාල ගෙවීම් සිදු කළ විට Schedule of rate පොතෙහි දැක්වෙන rate එකට පටහැනිවගෙවීම් සිදුකළ හෙයින් රු.91,612/- ක අතිරේක ගෙවීමක් සිදුකර තිබේ.

(ඈ) ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වවුනියා ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිල්ලේ රැඳිසිටින්නන් සඳහා පුනරුත්ථාපනය කළ කුටියේ කොන්ත්‍රාත් වැඩහි BOQ item No.24 ට අනුව tiles Ceramic of approved pattern colour supplied and fixed 600mm*600mm floor all including raking plaster & bedding in cement mortar වශයෙන් කරන ලද වැඩ කොටසට අදාල tiles භාවිතා නොකිරීම හේතුවෙන් රු.32,207/-ක අතිරේක ගෙවීමක් සිදුකර තිබිණ.

(ඉ) ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වවුනියා ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන වැඩහි BOQ item No.16 ට අනුව Supplying and installing Super flex suspended ceiling වැඩ අවසන් කළ බවට සඳහන් කර රු.945,350/- ගෙවීම් සිදුකර ඇත. එනමුත් සවිකළ ceiling Sheet වන gypsum ceiling sheet වශයෙන් දක්නට ලැබීම නිරීක්ෂණය විය.

4.3 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක අයිතිය නොමැති භාවිතා හැකි තත්ත්වයේ දක්නට ලැබෙන වාහන 12 ක හිමිකම් මාරුකර වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කිරීමට වවුනියා වසර 07 සිට වසර 26 කට අධික කාලයක් කිසිදු පියවරක් ගෙන නොමැත.

(ආ) වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහන 05 ක් භාවිතා කිරීමට පසුගිය වසර 02 සිට වසර 12 කට අධික කාලයක් පියවර ගෙන නොමැත.

(ඇ) පොරොත්තු ලේඛනය අනුව පවුල් නිවාස ඉල්ලුම්කරුවන් 90 දෙනෙක් සිටින අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස 03 ක් භාවිතා කිරීමට හැකි වන පරිදි තවත් නිල නිවාස 02 ක් අළුත්වැඩියා කර භාවිතා කළ හැකි අයුරෙන් පවතියි. තවදුරටත් භාවිතා කළ නොහැකි රජයේ නිල නිවාස පසුගිය වසර 04 සිට වසර 06 කට අධික කාලයක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට හැකි වන පරිදි අවශ්‍ය පියවර සිදුකර නොමැත.

4.4 රජයේ නිලධාරින්ගේ ඇප තැන්පත්

රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ 2022 මාර්තු 16 වන දින 04/2022 අංක දරණ චක්‍ර ලේඛ ප්‍රකාරව ඇප තැන්පත් ගෙවිය යුතු දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල නිලධාරින් 10 දෙනෙක් ඇප මුදල් ගෙවීමට අපොහොසත් වී ඇත.

4.5 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස කුලී හිඟ මුදල් රු.309,068/- ක් පසුගිය වසර 02 සිට පසුගිය වසර 05 කට අධික කාලයක් දක්නට ලැබෙන අතර අදාල හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත.

(ආ) වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 කට අයත් වාහන 29 ක වටිනාකම් ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශ වලට ගෙන යෑමට අවශ්‍ය පියවර සිදු කර නොමැත.

(ඇ) වවුනියා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රජයේ ඉඩම් දීර්ඝ කාලීන බදු මත ලබා දීම සම්බන්ධයෙන් අය කළ යුතු බදු මුදල සහ දඩ මුදල් රු.33,494,996/- අය කරවා ගැනීමට පසුගිය වසර 01 සිට වසර 47 දක්වා කාලයක් පියවර ගෙන නොමැත.

(ඈ) වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිරිසිදු කිරීමේ සේවාවක් කොන්ත්‍රාත් වගන්ති 2.18 ට අනුව වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පිරිසිදු කිරීමේ සේවා මිල ගණන් කැඳවීම් පත්‍රයේ සේවා කොන්දේසි 1.17 ට විරුද්ධව ගෙවීම් කිරීම ප්‍රකාරව සම්පූර්ණ සේවක පිරිස සේවයට වාර්තා නොකළ දිනයකට දඩ මුදල් රු.528,320/- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හා රු. 136,240/- ක් වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අයකර ගැනීමට පියවර ගෙන නොමැත.

(ඉ) වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් සහ වවුනියා දකුණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ යටතේ දක්නට ලැබෙන විශ්‍රාමිකයින් දෙදෙනෙකුට අතිරික්තව ගෙවා ඇති විශ්‍රාම මුදල් රු.201,440/- ක් අය කරවා ගැනීමට පසුගිය මාස 11 සිට මාස 23 කට අධික කාලයක් පියවර ගෙන නොමැත.

5. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචන වර්ෂයේ අවසානය තෙක් වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සේවක සංඛ්‍යා පුරප්පාඩු 57 ක් පවතියි.

J.A.S.D.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	2024 ඉලක්ක	2024 සාධන මට්ටම	මේ දක්වා ළඟා කරගත් සංවිධාන මට්ටමේ ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
01	සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන	862 Nos	862 Nos			✓
2	දරිද්‍රතාවය පිටු දැකීමට සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් සංඛ්‍යාව	160 Nos	7 Nos	✓		
3	දරිද්‍රතාවය පිටු දැකීම සඳහා සිදු කරන ලද සමෘද්ධි පොළ සංවර්ධන වැඩ සටහන් සංඛ්‍යාව	16 Nos	16 Nos			✓
4	සමෘද්ධි සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද නිවාස වල සංඛ්‍යාව	25 Nos	25 Nos			✓
5	දරිද්‍රතාවය පිටු දැකීමට සමෘද්ධි කැකුළු වැඩසටහන යටතේ ධාරිතා වර්ධන කරන ලද දරුවන්ගේ සංඛ්‍යාව	80 Nos	80 Nos			✓
6	මත්ද්‍රව්‍ය පිටු දැකීම සඳහා පවත්වන ලද සමාජ වැඩසටහන් සංඛ්‍යාව	120 Nos	120 Nos			✓
7	නැවත පදිංචි වූ නිවාස ඉදිකිරීම් වැඩසටහන් 2021 සහ 2023 වර්ෂයේ අඛණ්ඩ වැඩ යටතේ සම්පූර්ණ කරන ලද නිවාස වල සංඛ්‍යාව	205 Nos	205 Nos			✓
8	නාගරික සංවර්ධන සහ නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශයේ නැවත පදිංචි කිරීම්, නිවාස ඉදිකිරීම් වැඩසටහන යටතේ ලබා දෙන ලද නිවාස වල සංඛ්‍යාව	156 Nos	62 Nos	✓		

9	ඉදිකළ පුස්තකාල සංඛ්‍යාව	1 Nos	01 Nos			✓
10	ගමනාගමන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකළ මාර්ග	20.41km	19.27km			✓
11	නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ පානීය ජල ව්‍යාපෘතිය යටතේ නළ ජල පහසුකම් ලබා දෙන ලද නිවාස ඒකකවල සංඛ්‍යාව	2087 Nos	2087 Nos			✓
12	ලෝක ආහාර ව්‍යාපෘතියේ දේශීය නිෂ්පාදන මගින් ආහාර සැපයීමේ වැඩසටහන යටතේ ලබා දෙන ලද කුකුළන් ඇති කිරීමේ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	58 Nos	58 Nos			✓
13	වැඩිදියුණු කළ ක්‍රීඩා පිට්ටනි වල සංඛ්‍යාව	164 Nos	164 Nos			✓
14	ලබා දෙන ලද ග්‍රාමීය විදුලි සැපයුම් කිරීමේ ව්‍යාපෘති	10 Nos	10 Nos			✓
15	ආගමික ආයතන වල දිරිගැන්වීම් සහ සංවර්ධන ව්‍යාපෘති වල සංඛ්‍යාව	446 Nos	446 Nos			✓
16	සමාජ ආයතන වල දිරිගැන්වීම් සහ සංවර්ධන ව්‍යාපෘති වල සංඛ්‍යාව	526 Nos	526 Nos			✓
17	පුනරුත්ථාපනය කළ පොදු ළිං සංඛ්‍යාව	10 Nos	10 Nos			✓
18	පුනරුත්ථාපනය කළ ග්‍රාමීය අභ්‍යන්තර මාර්ග වල දිග ප්‍රමාණය	8.21 km	8.21 km			✓
19	පුනරුත්ථාපනය කළ කුඩා වාරිමාර්ග ව්‍යාපෘති වල සංඛ්‍යාව	05 Nos	05 Nos			✓

20	ඉදිකළ සොරොව්වල සංඛ්‍යාව	01 Nos	01 Nos			✓
21	සෞඛ්‍ය අංශයට අදාල ව්‍යාපෘති හා බලගැන්වීම්	03 Nos	03 Nos			✓
22	අධ්‍යාපන සඳහා ඉදිකළ හා නඩත්තු කළ ගොඩනැගිලි වල සංඛ්‍යාව	29 Nos	29 Nos			✓
23	පාසල් දැව භාණ්ඩ, උපකරණ ලබා දෙනු ලබන ව්‍යාපෘති සංඛ්‍යාව	84 Nos	84 Nos			✓
24	පෙර පාසල් සවිබල ගැන්වීම් වැඩසටහන් වල සංඛ්‍යාව	08 Nos	08 Nos			✓
25	කුඩා කර්මාන්ත සංවර්ධන වැඩසටහන	01 Nos	01 Nos			✓
26	අස්වැසුම ව්‍යාපෘතිය යටතේ සහන ලැබූ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	15511 Nos	15511 Nos			✓
27	උරුමය ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද ඉඩම් හිමිකරුවන්ගේ සංඛ්‍යාව	864 Nos	864 Nos			✓
28	නිකුත් කළ ඉඩම් බලපත්‍ර වල සංඛ්‍යාව	57600 Nos	57508 Nos			✓
29	රතුඑෑණු ලබාදෙන ලද ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව / වගා කළ භූමි ප්‍රමාණය	100 Nos / 50 ac	100 Nos / 50 ac			✓
30	සහල් බෙදා දුන් ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	40000 Nos	40000 Nos			✓
31	උඳු සහ මුං ලබා දෙන ලද ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	4000 Nos / 20000 kg /4000 ac	4000 Nos / 20000 kg /4000 ac			✓
32	එළු පාලනය ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව / ලබා දෙන ලද එළුවන් සංඛ්‍යාව	313 Nos / 947 goats	313 Nos / 947 goats			✓
33	ගව පාලන ව්‍යාපෘතිය - ලබා දෙන ලද ගවයින් සංඛ්‍යාව	20 Nos / 40 cattle	20 Nos / 40 cattle			✓

34	ප්‍රතිසංස්කරණය කළ කෘෂි ළිං සංඛ්‍යාව	09 Nos	04 Nos		✓	
35	TOM EJC අඹ පැළ කැවැන්ඩිස් කෙසෙල් පැළ ලබා දෙන ලද තරුණ කෘෂි ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව	08 Nos	13 Nos			✓
36	කෘෂි නවීකරණ ව්‍යාපෘතියේ අන්තර්ගතවූ ප්‍රතිලාභී සංඛ්‍යාව	500 Nos	500 Nos			✓
37	ගෙවීම් සිදුකළ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ සංඛ්‍යාව	2711 Nos	2711 Nos			✓
38	වකුගඩු දීමනා ලබාගත් රෝගීන් සංඛ්‍යාව	2691 Nos	2691 Nos			✓
39	ජීවනෝපාය සහන ලබා ගත් ස්වයං රැකියා වල නිරත වන්නන්ගේ සංඛ්‍යාව	11 Nos	8 Nos			✓
40	පෝෂණ වර්ධනය සඳහා ගෙවීම් ලබා ගත් ගැබිණි මාතාවන්ගේ සංඛ්‍යාව	1654 Nos	1670 Nos			✓
41	පෝෂණ මට්ටම ඉහළ දැමීම යටතේ සහන ලබාගත් පෙරපාසල් දරුවන්ගේ සංඛ්‍යාව	797 Nos	802 Nos			✓
42	ගුරු අභිමානී සම්මානලාභී ගුරුවරියන්ගේ සංඛ්‍යාව	10 Nos	10 Nos			✓
43	සෞඛ්‍ය ප්‍රවර්ධනය කළ පෙර පාසල් සංඛ්‍යාව	20 Nos	20 Nos			✓
44	සිටවූ ගස් සංඛ්‍යාව	10000 Nos	10000 Nos			✓
45	වල් ඉවත්කළ බිම් කොටස් සංඛ්‍යාව	1000 Nos	1000 Nos			✓
46	දෙවන බස සිංහල විෂයය යටතේ ප්‍රයෝජන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව	700 Nos	692 Nos			✓

47	අතුරුදහන් වූවන්ගෙන් වන්දි ලබා දෙන ලද පවුල් සංඛ්‍යාව	275 Nos	275 Nos			✓
48	වන්දි ලබා දෙන ලද සාමාන්‍ය පවුල් වල සංඛ්‍යාව	143 Nos	143 Nos			✓
49	පවත්වන ලද සංස්කෘතික උත්සව සංඛ්‍යාව	3 Nos	3 Nos			✓
50	ස්ථාපනය කළ සමාජ සංගම් වල සංඛ්‍යාව	102 Nos	102 Nos			✓
51	ආරක්ෂිත අවතැන්වීම් සඳහා සිදුකළ දැනුවත් කිරීම් වල සංඛ්‍යාව	8 Nos	11 Nos			✓
52	ආරක්ෂිතව අවතැන්වීම් සිදුකළ අයගේ සංඛ්‍යාව	100 Nos	488 Nos			✓

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු කෙටියෙන් දක්වන්න.

No	Goal/ Objective	SGT Target	Institutional -Target	Indicators of the Achievement	Target in 2024	Achieve-ment in 2024	Progress of the Achievement to date		
							0%-49%	50%-74%	75%-100%
1		1.3 ජාතික මට්ටමේ අඩු ආදායම් උපයන කොටස්කාශයේ ඇතුළත්ව සියලු දෙනා සඳහා වන සමාජ ආරක්ෂක සංවිධාන වල සහ පියවරයන් ක්‍රියාවට නැංවීම සහ 2030 හි අවධානමට ලක්වූවන් සහ දිළිඳු ප්‍රජාවට ප්‍රමාණවත් ආරක්ෂාව ලබා දිය හැකි වීම	අවදානම් වලට ලක්වූවන් සහ දිළිඳු ප්‍රජාවට ප්‍රමාණවත් ආරක්ෂාව සැපයීම	අස්වැසුම ව්‍යාපෘතිය යටතේ සහන ලද පවුල් සංඛ්‍යාව	15511	15511			✓
				ගෙවීම් කරනු ලැබූ විශේෂ අවශ්‍යතා සහිතවූවන්	2711	2711			✓
				වකුගඩු ගෙවීම් ලබාගත් රෝගීන් සංඛ්‍යාව	2691	2691			✓
				අතුරුදහන් වූවන්ගේ වන්දි මුදල් ලබා දෙනු ලබන පවුල් සංඛ්‍යාව	275	275			✓
				වන්දි මුදල් ලබාදෙන ලද සාමාන්‍ය පවුල් සංඛ්‍යාව	143	143			✓
		1.4 2030 වර්ෂයේදී සියලු පිරිමින් ගැහැණුන් විශේෂයෙන් දිළිඳු පවුල් සහ පීඩාවට ලක්වූවන්, අවධානමකට ලක්වූවන්ගේ ආර්ථික සම්පත් සහ මූලික සේවාවන් ලබාගැනීම, ඉඩම් සහ අනෙකුත් වත්කම් මතවූ හිමිකම්, පරම්පරාවන්, ස්වභාවික සම්පත්, යෝග්‍ය නවීන තාක්ෂණ මූල්‍ය හා ක්ෂුද්‍ර මූල්‍ය ණය සේවාවන් ලබා ගැනීමේදී සමාන අයිතිවාසිකම් තිබීම.	දිළිඳු පවුල් වල සාමාන්‍ය ආදායම ඉහළ දැමීම	දිළිඳුකම් පිටු දැකීමට සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වල සංඛ්‍යාව	160 Nos	7 Nos	✓		✓
				දිළිඳුකම් පිටු දැකීමට සිදුකළ සමෘද්ධි වෙළඳපොළ සංවර්ධන වැඩසටහන් වල සංඛ්‍යාව	16 Nos	16 Nos			✓
				ලෝක ආහාර ව්‍යාපෘතියේ දේශීය නිෂ්පාදන මගින් ආහාර ලබා දීමේ වැඩසටහන් ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද කුකුල් පාලන ව්‍යාපෘති සංඛ්‍යාව	58 Nos	58 Nos			✓
				ජීවනෝපාය සහන ලබාගත් ස්වයං රැකියා වල නිරතවූවන්ගේ සංඛ්‍යාව	11 Nos	8 Nos			✓
			ඉඩම් මත වූ හිමිකම් ලබා දීම	උරුමය වැඩසටහන යටතේ නිකුත් කළ ඉඩම් හිමිකම්පත්‍ර	864 Nos	864 Nos			✓
				නිකුත් කළ ඉඩම් බලපත්‍ර වල සංඛ්‍යාව	57600 Nos	57508 Nos			✓
			මූලික අවශ්‍යතා ලබා ගැනීමේදී සමාන හිමිකම් තිබීම	සහල් බෙදාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	40000 Nos	40000 Nos			✓
				සමෘද්ධි සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද නිවාස සංඛ්‍යාව	25 Nos	25 Nos			✓
				ලබා දෙන ලද ග්‍රාමීය විදුලි ව්‍යාප්ති ව්‍යාපෘතිය	10 Nos	10 Nos			✓
				දිළිඳුකම් පිටු දැකීම සඳහා සමෘද්ධි කැකුළු වැඩසටහන යටතේ ප්‍රවර්ධනය වූ කුඩා දරුවන් සංඛ්‍යාව	80 Nos	80 Nos			✓

		1.5 2030 වර්ෂයේ දිළිඳු ප්‍රජාව සහ පීඩාවට පත්වීමේ අවධානමට ලක්වූවන්ගේ සරලතාවන් ස්ථාපිත කිරීම.කාළගුණය පිළිබඳව තීවුර සිද්ධි හා අනෙකුත් ආර්ථික, සමාජීය හා පාරිසරික ගැටලු හා විනාශයන් සහ ප්‍රතිවිපාක	**අවතැන්වූ පවුල් සඳහා නිසි වාසස්ථාන ලබාදීම**	**නිවාස සහන ලබාදුන් පවුල් සංඛ්‍යාව**	361 Nos	267 Nos			✓.
				ඉදිකළ සොරොව් සංඛ්‍යාව	01 Nos	01 Nos			✓
2	කුසගින්න පිටුදැකීම	2.1 2030 වර්ෂය වන විට කුසගින්න පිටුදැක මහජනයාට විශේෂයෙන් දිළිඳු ජනතාවට සහ පීඩාවට පත් වීමට ඉඩ ඇති ජනතාව, අත දරුවන් වර්ෂය පුරාවට ආරක්ෂිත පිරිසිදු ආහාර ලබයි.	ආහාර නිෂ්පාදනය වැඩිකිරීම	රතුඵැණු බීජ ලබා දෙන ලද ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව වගා කළ බිම් ප්‍රමාණය	100 Nos / 50 ac	100 Nos / 50 ac			✓
				උඳු සහ මුං නිකුත් කළ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව වගා කළ බිම් ප්‍රමාණය	4000 Nos / 20000 kg / 4000 ac	4000 Nos / 20000 kg / 4000 ac			
				එළු පාලන ව්‍යාපෘතිය සඳහා එළුවන් ලබා දෙන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව / ලබා දෙන ලද එළුවන් සංඛ්‍යාව	313 Nos / 947 goats	313 Nos / 947 goats			✓
				ගව පාලන ව්‍යාපෘතිය සඳහා ගවයන් ලබා දෙන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව / ලබා දෙන ලද ගවයන් සංඛ්‍යාව	20 Nos / 40 cattle	20 Nos / 40 cattle			✓
				ප්‍රතිසංස්කරණය කරන ලද කෘෂි ළිං සංඛ්‍යාව	09 Nos	04 Nos			✓
				TOM EJC අඹ පැළ සහ කැවෙන්ඩිස් කෙසෙල් පැළ නිකුත් කළ තරුණ කෘෂි ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව	08 Nos	13 Nos			✓
		2. (අ) සංවර්ධනය වෙන රටවල් වල වීර්යයයෙන් ඌණ සංවර්ධිත රටවල් වල කෘෂි නිෂ්පාදන නිපුනතාවය වර්ධනය කර ගැනීමට සහයෝගය යටිතල පහසුකම් කෘෂි පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා සහ තාක්ෂණික ප්‍රවර්ධනය වර්ධනය කිරීම	කෘෂිකර්ම යටිතල පහසුකම් ප්‍රවර්ධනය	කෘෂිකාර්මික නවීකරණය ව්‍යාපෘතියේ අන්තර්ගත වූ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	500 Nos	500 Nos			✓

3	ශරීර සෞඛ්‍ය හා යහ ජීවිතය	3.1 2030 ලෝක ළදරු උපත් ප්‍රතිශතය 100,000 ට 70 අගය අවම කිරීම	ගැබිණි මාතාවන්ගේ පෝෂණ මට්ටම ඉහළ අගයක පවත්වා ගෙන යාම	පෝෂණය ඉහළ නැංවීමට අදාළව ගෙවීම් ලබාගත් ගැබිණි මාතාවන්ගේ සංඛ්‍යාව	1654	1670			✓
		3.5 මත්ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය භාවිතය හානිදායක මත්පැන් ඇතුළත්ව මත්ද්‍රව්‍ය වැරදි ආකාරයට භාවිතා කිරීම වළක්වා ප්‍රතිකාර කිරීම	මත්ද්‍රව්‍ය වැරදි ආකාරයට භාවිතා කිරීම වළක්වාලීම	මත්ද්‍රව්‍ය වළක්වාලීම සඳහා පවත්වන ලද සමාජ මට්ටමේ වැඩසටහන් වල සංඛ්‍යාව	120 Nos	120 Nos			✓
		3.8 අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සඳහා ආරක්ෂිත ප්‍රයෝජනවත් හා ප්‍රමිතියෙන් යුතු, ලාභදායි අත්‍යාවශ්‍ය එන්නත් ආදිය කෙරෙහි අවධානය යොමු කර ගෝලීය සෞඛ්‍ය ආරක්ෂාව ඉලක්ක ලභා කර ගැනීම	ප්‍රවර්ධිත සෞඛ්‍ය ආනයනය	සෞඛ්‍ය අංශයට අදාල ව්‍යාජ්ති සහ සවිබල ගැන්වීම	03 Nos	03 Nos			✓
4	ගුණාත්මක අධ්‍යාපනය	4.1 2030 සියලු පිරිමින් හා ගැහැණුන් නොමිලේ සමාන හා ප්‍රමිතියෙන් යුතු මූලික හා ද්විතික අධ්‍යාපනය අවසන් කර ඒ සම්බන්ධයෙන් වූ කාර්යක්ෂම ඉගෙනුම් අංග ලබා ගැනීම සහතික කිරීම	ප්‍රවර්ධනය කළ අධ්‍යාපන පහසුකම්	සමෘද්ධි සිප්දොර ශිෂ්‍යාධාර වැඩසටහනේ දිරිගැන්වූ දිළිඳු දරුවන්ගේ සංඛ්‍යාව	862 Nos	862 Nos			✓
				අධ්‍යාපනය සඳහා ඉදිකළ සහ නඩත්තු කළ ගොඩනැගිලි වල සංඛ්‍යාව	29 Nos	29 Nos			✓
				පාසල් දැව භාණ්ඩ උපකරණ ලබා දෙන ලද ව්‍යාපෘති වල සංඛ්‍යාව	84 Nos	84 Nos			✓
				ඉදිකළ පුස්තකාල සංඛ්‍යාව	01 Nos	01 Nos			✓
				සංවර්ධනය කළ ක්‍රීඩා පිට්ටනි සංඛ්‍යාව	164 Nos	164 Nos			✓
		4.2 2030 හි සියලු පිරිමින් සහ කාන්තාවන්ට ප්‍රමිතියෙන් යුතු මූලික අධ්‍යාපනය ලැබීම සහතික කිරීම	ප්‍රමිතියෙන් යුතු මූලික අධ්‍යාපනය ලැබීම සහතික කිරීම	සවිබල ගැන්වූ පූර්ව ළමාවිය මධ්‍යස්ථාන සංඛ්‍යාව	08 Nos	08 Nos			✓
				පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ ප්‍රයෝජන ලත් පූර්ව ළමාවිය දරුවන්ගේ සංඛ්‍යාව	797	802			✓
				ගුරු අභිමානී සම්මාන ලත් පෙර පාසල් ගුරුවරියන්ගේ සංඛ්‍යාව	10	10			✓
				සෞඛ්‍ය ඉහළ නංවනු ලැබූ පෙර පාසල් සංඛ්‍යාව	20	20			✓
5	පිරිසිදු පානීය ජලය හා සෞඛ්‍ය	වර්ෂ 2030 වන විට සියළුම ජනතාව වෙත ජාත්‍යන්තර තත්වයට සමාන ආරක්ෂාකාරී ජල පහසුකම් අඩු වියදමකින් ලබාගැනීමට පහසුකම් සැපයීම	ආරක්ෂාකාරී හා ලාභදායි පානීය ජලය ලබා ගැනීම සියලු දෙනා වෙත සෞඛ්‍ය	රජයේ සහනාධාර යටතේ ජල නළ සම්බන්ධතාවය ලබා දෙන නිවාස ඒකක වල සංඛ්‍යාව	2087 Nos	2087 Nos			✓
				ප්‍රතිසංස්කරණය කළ පොදු ළිං ප්‍රමාණය	10 Nos	10 Nos			✓
				සෞඛ්‍ය අංශයට අදාළ ව්‍යාපෘති සහ නවීකරණය කිරීම	01 Nos	01 Nos			✓

6	තිරසාර නගර සහා සමාජය	11.2 ආර්ථික ප්‍රවර්ධනය සහ මානව සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ප්‍රමිතියෙන් හා විශ්වසනීය භාවයෙන් යුතු යටිතල පහසුකම් ලබා දීමෙන් සියලු දෙනාට පහසු සහන ලාභදායි ප්‍රවාහන පහසුකම් ලබා දීම	ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය	ප්‍රතිසංස්කරණය කළ ග්‍රාමීය මාර්ග වල දිග ප්‍රමාණය	20.41 km	19.27 km			✓
				ප්‍රතිසංස්කරණය කළ ග්‍රාමීය අභ්‍යන්තර මාර්ග වල දිග ප්‍රමාණය	8.21 km	8.21 km			✓
			ව්‍යවසායකයින් දිරිගැන්වීම සහ කුඩා හා මධ්‍යම ආයතන වල විධිමත් කිරීම දිරිගැන්වීම	කුඩා කර්මාන්ත සංවර්ධන වැඩසටහන්	01 Nos	01 Nos			✓
			සමාජ යටිතල පහසුකම් සංවර්ධනය	සමාජ ආයතන සවිබල ගැන්වීම සහ සංවර්ධන වැඩසටහන් වල සංඛ්‍යාව	526 Nos	526 Nos			✓
7	තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන	වර්ධනය සහ නිපුනත්වය සැලකිල්ලට ගෙන සියලු රටවල් ඉදිරියේ ක්‍රියාත්මක වන ආකාරයේ පරිභෝජනය සහ නිෂ්පාදන ක්‍රමය දස (10) වර්ෂ සැලැස්ම ක්‍රියාත්මක කිරීම	නිෂ්පාදන වර්ධනය කිරීම	නවීකරණය කළ වැව් වල සංඛ්‍යාව	05 Nos	05 Nos			✓
				කුඩා කර්මාන්ත සංවර්ධන වැඩසටහන	01 Nos	01 Nos			✓
8	අසමානතා අඩු කිරීම	**8.1 දේශපාලනික, සමාජීය සහ ආර්ථික වශයෙන් සියලුම පුද්ගලයන් ඇතුළත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම**	**ආගමික ආයතන ශක්තිමත් කිරීම**	සංවර්ධනය කළ හා ශක්තිමත් කළ ආගමික ආයතන සංඛ්‍යාව	446 Nos	446 Nos			✓
		8.2 හොඳින් සැලසුම් කරන ලද සහ මනාව කළමනාකරණය කරන ලද සංක්‍රමණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් මිනිසුන්ගේ ක්‍රමවත්, ආරක්ෂිත, විධිමත් සහ වගකීම් සහිත සංක්‍රමණයට පහසුකම් සැලසීම	**ආරක්ෂිත සහ වගකීම් සහිත සංක්‍රමණයට පහසුකම් සැලසීම**	**ආරක්ෂිත සංක්‍රමණය පිළිබඳ සිදුකළ හඳුන්වාදීමේ වැඩසටහන් සංඛ්‍යාව**	8 Nos	11 Nos			✓
				ආරක්ෂිත සංක්‍රමණයන් සිදුකළ පුද්ගලයින් සංඛ්‍යාව	100 Nos	488 Nos			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ඇති අභියෝග

1. දිළිඳුකම පිටු දැකීම.

සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් නව ආදායම් ප්‍රවර්ධනය කළ අතර පවුල් 361 කට නිවාස පහසුකම් ලබාදීම මගින් ප්‍රතිලාභ ලැබුණු අතර, අතිරේකව වෙනත් අවශ්‍යතා හඳුනාගැනිමෙන් පසු මූල්‍ය ප්‍රභවයන් හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් පවතී.

2. සාගින්න පිටු දැකීම

ඉතාමත් දිළිඳු පවුල් 15,511 ක් අස්වැසුම වැඩ සටහන යටතේ ඇතුළත් කර ඇත. එනමුත් සාගින්න , කිසිදු ආහාරයක් නොමැතිව සිටීම යනු අප ප්‍රදේශයේ ඉතාමත් අඩු අගයක් ගනී. පසුගිය වර්ෂ වල ආහාර නිෂ්පාදනය, වර්ෂාව හේතුවෙන් හානියට පත්විය. ආහාර, වාරිමාර්ග පහසුකම් ප්‍රවර්ධන කටයුතු අතිශයින්ම වැදගත් කාරණාවක් බව දැනට හඳුනාගෙන ඇත. ආහාර නිෂ්පාදන ධාරිතාව ප්‍රවර්ධනය කිරීම හා ඵලදායිතාවය ඉහළ නැංවීමට වාරිමාර්ග පහසුකම් ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව හඳුනාගෙන ඇත. අත්හරින ලද වැව් බොහෝමයක් ප්‍රතිසංස්කරණය කළයුතු බව පෙන්වා දෙන අතර, දැනට වගා නොකරන පුරන් කුඹුරු වගා කිරීමට කටයුතු කලයුතු බව පෙන්වා දෙමි.

3. ඉහළ සෞඛ්‍ය ආරක්ෂාව හා සුවබර ජීවිතයක්

දිස්ත්‍රික්කයේ නවීන සෞඛ්‍ය පහසුකම් වල අවශ්‍යතාවය මේ දක්වා පවතී.

4. ගුණාත්මක අධ්‍යාපනය

නගරාසන්න පාසැල් වල කාර්ය සාධන මට්ටම් සතුටුදායක මට්ටමක පැවතුනද ග්‍රාමීය ප්‍රදේශයන්හි පාසැල් කාර්ය සාධන මට්ටම ප්‍රශස්ථ මට්ටමට ළඟා වී නොමැත. තෝරා ගත් විෂයන් සඳහා ග්‍රාමීය පාසැල් වල අවශ්‍ය ගුරුවරුන්ගේ ඌනතාවය විශාල ගැටළුවකි.

5. පිරිසිදු ජලය හා සෞඛ්‍ය

දිස්ත්‍රික්කයේ ජාතික ව්‍යාපෘතිය යටතේ අන්තර්ගත කර ඇත. ග්‍රාමීය ජල යෝජනා ක්‍රම, සමාජ ජල යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම මගින් මෙම ගැටළුවට විසඳුම් සෙවිය හැකිය. තවද භූගත ජලයේ ප්‍රමිතිය ඇතැම් ප්‍රදේශයන්හි යෝග්‍ය නොවන අතර බීමටද යෝග්‍ය නොවන බැවින් දැඩි ලෙස වකුගඩු රෝගාබාධ වලට ගොදුරු වේ. තව ද මෙම දිස්ත්‍රික්කය ජාතික වකුගඩු රෝග නිවාරණ ව්‍යාපෘතිය යටතේ අන්තර්ගත කර ඇත.

6. බල ශක්ති

සියළුම පවුල් ඒකක ජාතික විදුලි බල පද්ධතිය සමඟ සම්බන්ධ කර ඇත. තවද සූර්ය බල ශක්ති නිෂ්පාදනයට ප්‍රමාණවත් අවස්ථාවක් ප්‍රදේශයේ දක්නට ලැබීම හේතුවෙන් පෞද්ගලික අංශයේ දායකත්වය හා ආයෝජනය අපේක්ෂා කෙරේ.

7. කර්මාන්ත නවෝත්පාදනය හා යටිතල පහසුකම්

මාර්ග හා පාළම් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය විශාල වශයෙන් පවතී. වාර්ෂිකව ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය මෙම ගැටළුවට විසඳුමක් ලබාදීම තරම් ප්‍රමාණවත් නොවේ.

8. තිරසර නගර හා සමාජ

මාර්ග ජාල වල ජල ප්‍රවාහන පද්ධතීන් හි සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. වවුනියාව මහ රෝහල සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ඉඩම් නොතිබීම හේතුවෙන් දැනට පොදු ගැටළුවක් ලෙස එය නිර්මාණය වී පවතී. ඉදිකරන ලද ආර්ථික කේන්ද්‍රස්ථානය හා ජාතික ක්‍රීඩාංගනය යනාදීන් මහජන උපයෝගීතාවය සඳහා ජනතා සතු කලයුතු වේ.

9. අතිරික්තය, පරිභෝජනය හා නිෂ්පාදනය

නව තාක්ෂණික ශිල්ප ක්‍රම උපයෝගි කිරීමෙන් කෘෂි නිෂ්පාදනය වර්ධනය කළයුතුයි. වාරිමාර්ග යෝජනා ක්‍රම ඇළ මාර්ග සංවර්ධනය කිරීම් ආදිය කෙරෙහි අවධානය යොමු කලයුතුවේ.

- නිගමනය

ශ්‍රී ලංකා රජය තම රටේ ජනතාවගේ ආර්ථික සමාජ සංවර්ධනය ඉලක්ක කරමින් විවිධ වූ ව්‍යාපෘතින් 2023 වර්ෂයේදි ක්‍රියාත්මක කර තිබුණි.

1. විමධ්‍යගත අයවැය යෝජනා
2. ප්‍රාදේශිය සංවර්ධන වැඩසටහන
3. විශේෂ දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘති
4. සමෘද්ධි වැඩසටහන් / අස්වැසුම ව්‍යාපෘතිය
5. කඩිනම් නැවත පදිංචි කිරීමේ වැඩසටහන
6. පානීය ජල වැඩසටහන
7. ලෝක ආහාරම වැඩසටහන

ඉහත ව්‍යාපෘති දරිද්‍රතාවය ඌණ සංවර්ධනයෙන් පවතින ග්‍රාමීය ජන කොට්ඨාශ ජීවන තත්වය ඉහළ ගැන්වීම අරමුණු කොට ගත් අතර තිරසර සංවර්ධනය ඉලක්ක කර ගැනීමට විශාල වශයෙන් දායකත්වය ලබාදේ. එනමුත් මෙම සමාජ කොට්ඨාශයේ අවශ්‍යතාවයන් බහුල වුවද රටේ මූල්‍ය තත්වයන් උක්ත ඉලක්ක කෙටි කාලයක් තුල සාක්ෂාත් කර ගැනීමට ප්‍රමාණවත් නොවන්නේය.. එබැවින් මෙම අරමුණ ලගා කර ගැනීමට සැලකිය යුතු කාල පරිජ්ඡේදයක් අවශ්‍ය වන අතර සාමකාමී වාතාවරණයක් හා ස්ථාවර රාජ්‍යයක් ද අවශ්‍ය කාරණාවකි.

06 පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	29	23	**06** (පුරප්පාඩු)
තෘතිය	16	08	**06**(පුරප්පාඩු)
ද්විතිය	449	420	**29** (පුරප්පාඩු)
ප්‍රාථමික	63	58	**05** (පුරප්පාඩු)

6.2 අරමුදලේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇත්තේ කෙසෙදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මානව සම්පත් ඌනතාවය පවතින අවස්ථාවේදී කාර්යාල කටයුතු කරගෙන යාමේ අපහසුතාවයට මුහුණ දියයුතු වුවත් අනෙකුත් සේවකයන්ගේ රාජකාරී බහුල වීමත් සමග ආයතනයේ කාර්යක්ෂමතාවය අඩුවීමට හේතුවේ.මේ හේතුවෙන් ජනතාවට අවශ්‍ය සේවාවන් නිසිලෙස ලබාදීමට නොහැකි වීමට ඉඩකඩ පවතී.

විශාල ප්‍රමාණයේ මානව සම්පත් පවතින අවස්ථාවකරාජකාරී කටයුතු බෙදාදීමේ අපහසුතාවයකටදමුහුණ දීමට සිදුව පවතී.අතිරික්ත සේවකයින් හේතුවෙන් ආයතනයේ වියදම්ද වැඩිවී පවතී.ඌනතාවයක් හෝ අතිරික්තයක් පවතින මානව සම්පත් ආයතනයේ කාර්ය සාධනයට බාධාවක් ඇති කිරීමට හේතුවක්ව පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

ව්‍යාපෘතියේ නම	පුහුණු ව ලැබූ නිලධරයන් සංඛ්‍යාව	ව්‍යාපෘති කාලය (දින)	මුලු ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය		නිමැවුම/ දැනුම ලගා කර ගැනීම
කාර්යාල ක්‍රමය	50	1 දින	0.00	දේශීය	-	කාර්යාල ක්‍රමවේද වලට අදාළව නිලධරයන් පුහුණු කිරීම
අළුතෙන් පත්වීම් ලද නිලධරයන් පුහුණු කිරීම්	21	15 දින	190000	දේශීය	-	නවක ග්‍රාම නිලධාරීන් හට කාර්යාල ක්‍රමවේද / ග්‍රාමයේ පුහුණු කිරීම්
නිලධරයන්ගේ ක්ෂේත්‍ර පුහුණුව	21	45 දින	0.00	දේශීය	-	නවක ග්‍රාම නිලධාරීන් හට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රායෝගික ක්‍රම/ ගමේ ප්‍රධානි වශයෙන් දැනුම ලබා දීම
නිලධාරීන්ගේ ධනාත්මක ජීවිතය ප්‍රවර්ධනය කිරීම	200	1 දින	170000	දේශීය	-	කාර්යාල නිලධරයන්ගේ ධනාත්මක දැනුම ප්‍රවර්ධනය කර කාර්යාලීය රාජකාරි, මහජනතාවගේ සංහිඳියාව ප්‍රවර්ධනය කර ඉතා හොඳ මහජන සේවයක් ලබා දීම
පරිගණක භාවිතය සහ පරිගණක පද්ධති ප්‍රවර්ධන පුහුණුව	20	4 දින	650000	දේශීය	-	කාර්යාලීය පරිගණක භාවිතය සහ පද්ධතියේ ඇතිවන අඩුපාඩු මග හරවා ගැනීම
සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණය කිරීම් සම්බන්ධයෙන් නිලධරයන් පුහුණු කිරීම්	145	20 දින	90000	දේශීය	-	ගම්මාන වල පැවැත්වෙන සංවර්ධන ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කොට අඩුපාඩු සම්පූර්ණ කිරීම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූලනොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූලවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූලවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූලවේ		
1.6	වෙනත්	අනුකූලවේ		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා ණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛන (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීම	අනුකූලවේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		

4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	**වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම**	අනුකූලවේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තබීම	අනුකූලවේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූලවේ		

8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පපරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.2	**ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම**	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූලවේ		
9	වාහන කළමණාකරණය			
9.1	සංචිත වාහනය සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූලවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලවේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3	**බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම**	අනුකූලවේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූලවේ		
12	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2	නිහ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර කිරීම	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	ආදායම් ගිණුම්			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල නිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධනය වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		